www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මාක්ස්වාදය, ඉතිහාසහ සහ සමාජවාදී විඥානය

## *11-13 පරිච්ඡේද*

**Marxism, History & Socialist Consciousness**
**Chapters 11-13**

**ඩේවිඩ් නෝර්ත් විසිනි**

***හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශන ආයතනය වන මේරිං බුක්ස් ඩේවිඩ් නෝර්ත් විසින් රචිත*** Marxism, History & Socialist Consciousness ***(මාක්ස්වාදය, ඉතිහාසය සහ සමාජවාදී විඥානය) නම් වූ නව ග්‍රන්ථයක් පල කර ඇත. එය දැන් අපගේ වෙබ් අඩවිය හරහා කෙලින් ම මිලදී ගත හැකි ය. එය රචනා කරන ලද්දේ එක්සත් ජනපදයේ සමාජවාදී සමානතා පක්යේ පූර්වගාමියා වූ වර්කර්ස් ලීගයේ හිටපු සාමාජිකයන් වන ඇලෙක්ස් ස්ටයිනර් හා ෆ්‍රෑන්ක් බෙනර් විසින් හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ වැඩකටයුතු සම්බන්ධයෙන් කරන ලද*** **Objectivism or Marxism** ***(වෛෂයිකවාදය ද මාක්ස්වාදය ද) නම් වූ විවේචනයකට පිලිතුරු වසයෙනි.***

***අපි එම ග්‍රන්ථයේ පෙල කොටස් වසයෙන් පල කිරීම ආරම්භ කලෙමු. එහි පෙරවදන දෙසැම්බර් 10 දා පල වූ අතර 1. 2 හා 3 වන පරිච්ඡේද දෙසැම්බර් 11 දා ද 4 සිට 7 දක්වා පරිච්ඡේද දෙසැම්බර් 13 දා ද 8 සිට 10 දක්වා පරිච්ඡේද දෙසැම්බර් 15 දා ද පල විය. 11 සිට 13 දක්වා පරිච්ඡේද පහත පල වේ. ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශන ආයතනය වන කම්කරු මාවත ප්‍රකාශකයන් විසින් මෙය සිංහල භාෂාවෙන් ග්‍රන්ථයක් ලෙස පල කරනු ලැබ ඇත.***

### 11. 'යුතෝපියාව' සඳහා ව්‍යායාමයේ මුලාරම්භයෝ

අප විසින් විප්ලවවාදී ක්‍රියා මාර්ගයේ සාරභූත අන්තර්ගතය ලෙස ඔබගේ ව්‍යාජ-යුතෝපියානු (මනෝරාජික) ව්‍යවසාය පිලිගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබීම වනාහි ''සමාජවාදී පන්ති විඥානය සඳහා අරගලය මත වෛෂයිකවාදය විසින් ඇති කොට තිබෙන්නා වූ නාශක බලපෑමේ විපාකයක්'' බව පෙන්වා දීම ජාත්‍යන්තර කමිටුවට විරුද්ධව චෝදනා පත්‍රයක් ගොඩ නගා ගැනීමට ඔබ දරන ප්‍රයත්නයේ අරමුන යි. එ පමනක් නො වේ. "යුතෝපියානුවාදය පිලිබඳ (මගේ) කර්කශ හෙලා දැකීම" මගින් පෙන්නුම් කෙරෙන්නේ 'මානුෂික සාධක පාච්චල් කරන' හා සමාජවාදී පන්ති විඥානය සඳහා අරගලය අවමානයට පාත්‍ර කරන ව්‍යාජ හා ලඝුකාරී භෞතිකවාදය විසින් " මාක්ස්වාදය දිගින් දිගටම රෝගී කරන බව" යි.

ජාත්‍යන්තර කමිටුව ද මගේ ම න්‍යායික හා දේශපාලන වැඩ කටයුතු ද පිලිබඳ මෙවන් දරුනු චෝදනාවක් එල්ල කිරීම කරා ඔබ එලඹියා වූ, දශකයකට ද වැඩි කාලයක් පුරා වැටී ඇති මාවත කුමක් දැයි ආපසු සොයා බැලීම මේ අවස්ථාවේ දී අවශ්‍යව පවතී.

බ්‍රෙනර් සහෝදරය, 1998 දී, ඔබ ලිංගිකත්වය සහ ස්ත්‍රී-පුරුෂ (ජෙන්ඩර්) අනන්‍යතාව පිලිබඳ *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* සපයා, අප විසින් පල කිරීම ප්‍රතික්ෂේප කරන ලද දිගු ලිපිය අප ගමන් කරමින් සිටින්නේ ප්‍රතිමුඛ දේශපාලන කක්ෂයන් දිගේය යන්න පිලිබඳ ප්‍රථම බරපතල ඇඟැවීම විය. අපට පෙනීගිය පරිදි මෙම ලිපිය ලිංගික යොමුවේ දී ජීව ස්වභාවයේ අර්ථභාරය මුලුමනින් ම පිලිකෙව් කිරීම හෝ අවම කිරීම කලා වූ අතිශයින් ම සමපේක්ෂී හා සැකකටයුතු ප්‍රස්තුතයන් මත පදනම් වූවකි. පරිනාමික ජීව විද්‍යාව හෝ මානව විද්‍යාව පිලිබඳ බරපතල අධ්‍යයනයක් මගින් මෙම ලිපිය සංනිවේදිත වූ බවක් දක්නට තිබුනේ නැත. මෙම ලිපිය සමාලෝචනය කල ඩේව් වොල්ෂ් සහෝදරයා මේ පිලිබඳ තම ශංකාවන් සමහරක් ඔබේ අවධානයට ඉදිරිපත් කලේ ය. මෙයට 1998 ජුනි 28 දින ඔබ එවූ පිලිතුර අප ඔබගේ ලිපියට දැක් වූ විරෝධයන් සන්තෘප්ත කිරීමට අසමත් වූවා පමනක් නො ව ඔබගේ අලුත් ක්‍රියාමාර්ගික වැඩ සටහන ගැන අපගේ සිත් තුල ශංකා දැනැවිය.

ඔබගේ ලිපිය අපට, "(ජෙන්ඩර්) ලිංග ගනයන් පිලිබඳ විකල්ප න්‍යායයක්" වර්ධනය කිරීම ඉතාම හදිසි ආවශ්‍යකත්වයක් බවට පත්ව ඇතැයි ද, "මෙය පවුල ප්‍රතිව්‍යුහගත කිරීම පිලිබඳ සමාජවාදී ඕනෑ ම ව්‍යාපෘතියක් මත ප්‍රගාඪ බලපෑමක් ඇති කරනු ඇතැයි" ද ''මෙම ප්‍රයුක්තිය සම්බන්ධයෙන් මාක්ස්වාදීන්ට පවත්නා පරදු ඉතා ඉහල" යයි ද, "මෙවන් ප්‍රශ්නයක් පිලිබඳව අප ගන්නා ආස්ථානයට අප විප්ලවයක් කිරීම

සඳහා දරන ප්‍රයත්නයට ආධාරවීම - හෝ බාධා කිරීම - සිදු කල හැකි ය" යි ද ඔබගේ ලිපිය අපට දැක් විය. ඔබේ ලිපිය අප වෙත එන තෙක් ලිංගිකත්වය පිලිබඳ නව සංකල්පනයක් හෝ "ලිංගිකත්වය පිලිබඳ මාක්ස්වාදී න්‍යායය"ක් තබා "පවුල ප්‍රති ව්‍යුහගත කිරීම සඳහා සමාජවාදී ව්‍යාපෘතියක්" ගැන හදිසි අවශ්‍යතාවයක් ඇතැ යි සිතක් පහලව තිබුනේ නැත. එපමනක් නො ව - පාඨකයා කම්පනයට පත් කිරීමට සිතාමතා ම හා බාල අන්දමින් ලියා තිබුනු - බ්‍රෙනර් සහෝදරයාගේ ලිපියේ ශෛලිය පැහැදිලිව ම සාහිත්‍යමය සෞන්දර්යයෙන් හීන වීය.[13] එහෙත් අන් සියල්ලට වඩා නපුරු කරුන වූයේ ලිපිය එහි වූ ප්‍රමානාතික්‍රාන්ත හා කුප්පන තර්කයන්ට රුකුල් වසයෙන් විද්‍යාත්මක ලියවිල්ලකින් එකම උද්ධෘතයක් හෝ ගෙනහැර දැක්වීමට අසමත්වීම ය.

ලිංගිකත්වය පිලිබඳ ඔබේ ලිපිය පල කිරීමට අපගේ ප්‍රතික්ෂේපනය සමග ඔබ අමනාපව සිටි බව අපට නො-නිල වසයෙන් අසන්නට ලැබුනු නමුත්, නව මතභේදයන් 2002 එලඹෙන තෙක් පැන නැංගේ නැත. 2002 මැයි 30 වන දා *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* ඕස්ට්‍රේලියාවේ සමාජවාදී සමානතා පක්ෂයේ ලේකම් වූ ද *ලෝසවෙඅ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ* සාමාජිකයෙකු වූ ද නික් බීම්ස් සහෝදරයා විසින් සමාජවාදය යටතේ ජීවිතය පිලිබඳව පාඨකයෙකු විසින් අසල ලද ප්‍රශ්නයන්ට පිලිතුරු වසයෙන් ලියන ලද ලිපියක් පල කලේ ය. මෙය මතු කරන ලද ප්‍රශ්න ප්‍රයුක්තීන් මාලාවකට අදාල විය; මෙයට ආර්ථික කාර්යක්ෂමතාවය සහ පූර්න ස-රැකියාව අතර සම්බන්ධතාවය; පෞද්ගලික ප්‍රේරනය හා ආරම්භකත්වය පිලිබඳ ගැටලුව, කුඩා ව්‍යවසායයන්ගේ අනාගතය, රාජ්‍ය නිගමන නිර්මානයේ රූපයන්, අනාගත ලෝක අගනුවරක නියම පිහිටීම, සමාජවාදී සමාජයේ සදාචාරාත්මක පදනම්, පවුල මත සමාජවාදයේ බලපෑම, මානව අයිතිවාසිකම් හා පරිසරවේදය ඇතුලත් විය. සමාජවාදය අලුතින් හඳුන්වනු ලැබූවන් සමග මතුවන ප්‍රශ්නයන් වර්ගයට මේවා අයත් විය. මෙම ප්‍රශ්නයන්ට බරපතල පිලිතුරක් දීම අවශ්‍ය වන අතර, මාක්ස්වාදීහු න්‍යායික හා දේශපාලන පැහැදිලිකමේ ආසක්තය උදෙසා මෙය ද වටහා දීමට කැමැති වෙති: සමාජවාදය කල්තබා නියම කරන ලද වට්ටෝරු මාලාවකින් සමන්විත වන්නේ නැත. මින් අදහස් වන්නේ, සෑම තත්වයන් තුල ම, අප සමාජවාදයේ අනාගතය පිලිබඳව සමපේක්ෂනය කිරීම ප්‍රතික්ෂේප කරන්නේ ය යන්න නො වේ. එහෙත් ඓතිහාසික භෞතිකවාදීන් හැටියට අපි එවන් සමපේක්ෂනයන්හි සීමාවන් වටහා ගනිමු; එම වැටහීම කෙසේ වෙතත් ධනේශ්වර නිෂ්පාදන විධියේ ද එය පැනනංවන සමාජ සම්බන්ධතාවයන්ගේ ද සැබෑ ප්‍රතිසතිතාවන් පිලිබඳ ප්‍රගාඪ විශ්ලේෂනයක් මත පදනම් වී ගත යුතුව ඇත. එතකුදු නොව සමාජවාදී සමාජයක් වනාහී නායකයන් විසින් කල්තබා නියම කර ගන්නා ලද මනෝ-රටාවකට අනුව නොව කම්කරු පන්තියේ ස්වයං-විමුක්තියේ ප්‍රකාශනයක් ලෙස පැන නගිනු ඇති අති මූලික විලක්ෂනයන්ගෙන් සමන්විත එකකි.

අනාගත සමාජවාදී සමාජයක් පිලිබඳ පින්තූරයක් අඳින ලෙස කරන ලද ඉල්ලීමට බීම්ස් පිලිතුරු දුන්නේ මේ පිලිවෙත අනුව ය. [බලන්න http://www.wsws.org/articles/2002/ corr-m30.shtml]

> සමාජවාදී සමාජයක් වර්ධනය වීම පුද්ගලයෙකු, දේශපාලන පක්ෂයක්, හෝ ආන්ඩු අධිකාරයක් විසින් නියම කරන ලද වට්ටෝරු මාලාවක් අනුව සිදුවනු නැත. ඒ වෙනුවට එය වර්ධනය වනවා ඇත්තේ ඉතිහාසයේ ප්‍රථම වරට තමන්ට ඉහලින් නිදහස් වෙලඳ පොලක හෝ නිලධර අධිකාරයක ආධිපත්‍යයෙන් නිදහස්ව තම දෛනික ජීවිතයේ කොටසක් ලෙස දැනුවත්ව තමන්ගේ ම සමාජ සංවිධානය පාලනය කර ගනු ඇති සමාජයේ සාමාජිකයන්ගේ ක්‍රියාකාරිත්වයේ පදනම මත ය." නික් අවධාරනය කල තවත් දෙයක් නම්, සැබෑ මානව විමුක්තිය සාක්ෂාත් කිරීම සඳහා යත්න දරන සමාජයකට භෞතික පූර්ව කොන්දේසිය වන්නේ "හුදෙක් තම ජීවිතය පවත්වා ගැනීම සඳහා අවශ්‍ය සම්පත් සපයා ගැනීම සඳහා දවසේ වැඩි කාලයක් ගෙවීමට මානව වර්ගයාගේ අති මහත් බහුතරයට සිදු නො වන්නාවූ අවස්ථාවක් කරා ශ්‍රමයේ සමාජ නිෂ්පාදනීයතාවය වර්ධනය කිරීම ය. මානව සංස්කෘතියේ වර්ධනය උදෙසා ධනවාදය විසින් කරනු ලැබ ඇති අතිමහත් ප්‍රතිපදානය වන්නේ නිෂ්පාදන බලවේගයන්ගේ හා ශ්‍රම ඵලදායිත්වයේ නිරන්තර වර්ධනය මගින්, එය විසින් එවන් සැබෑ මානව විමුක්තියක් උදෙසා අත්‍යවශ්‍ය භෞතික පදනම් නිර්මානය කර තිබීම ය". මෙම භෞතික පදනම් මත සමාජවාදී සමාජයකට ලිපිකරුවාගේ ලියුමේ ඉස්මතු කර තිබූ ආර්ථික සහ සමාජ ප්‍රශ්නයන්ගෙන් සමහරක් විසඳ ගැනීමට ඉඩ තිබෙන ආකාරය, නික් සැකෙවින් සටහන් කලේ ය. සදාචාරය සම්බන්ධ ප්‍රයුක්තිය පිලිබඳව බීම්ස් " මාක්ස්වාදය සෑම විට ම කිසියම් සාදාචාර ආධානයන් පැටවීමට දැරෙන ප්‍රයත්නයන් ප්‍රතික්ෂේප කරන බවත් සමාජය සෑම කල්හිම පන්තීන්ට බෙදී පැවැතී ඇති හෙයින්, සදාචාරය වනාහි පන්ති ප්‍රයුක්තියක්" බවත් සලකුනු කලේ ය. ඔහු මෙසේ ද පැවැසී ය, "සදාචාර සාරධර්මයෝ එක්කෝ පාලක ස්තරයේ ආසක්තයන් යුක්ති යුක්ත කරති, නැත හොත් පීඩිත පන්තීන්ගේ අවශ්‍යතා නියෝජනය කරති. පන්ති සමාජය අහෝසි කල කල්හි, නව සදාචාරයක් වර්ධනය වනු ඇත." මෙම ප්‍රතිචාරය පැහැදිලිව ම මාක්ස්වාදය සහ සදාචාරය පිලිබඳ අවසාන වචනය යයි අදහස් නො කරන ලදී. එහෙත් එය පාඨකයෙකුගේ ප්‍රශ්නයන්ට පිලිතුරු හැටියට ලියන ලද කෙටි ලිපියක සන්දර්භයේ දී සෑහෙන සහ නිරවද්‍ය විය. එසේ ම ඉමහත් සංකීර්නත්වයක් දරන්නා වූ පවුල පිලිබඳ ප්‍රයුක්තියේ දී නික් නිවැරදිව ම පහත සඳහන් වචනවලට සීමා විය. "සමාජවාදී සමාජය වට්ටෝරු දරා සිටිනු නැත.

එහෙත් තමන් අර්ථ සහගත යයි දක්නා වූ සබඳතාවයන්ට නිදහසේ ඇතුලුවීමට අවශ්‍ය භෞතික සම්පත් ජනයාට තිබෙනු ඇත."

බ්‍රෙනර් සහෝදරය ඔබ එකල්හි 2002 ජූලි 24 දාතමින් ලියූ ලිපියක බීම්ස් තමාගේ පාඨකයාගේ ප්‍රශ්නවලට පිළිතුරු දී තිබුනු ආකාරය පිළිබඳ ඔබේ දැඩි නො එකඟතාවය සටහන් කර තැබූවෙහි ය. ඔබ මෙසේ ලිවී ය. ''බීම්ස්ගේ පිළිතුරෙන් සමකාලීන මාක්ස්වාදයේ දෘෂ්ටියෙහි යුතෝපියාව (මනෝරාජ්‍යය) පවත්නේ කොහි ද යන්න පිළිබඳ හැඟීමක් අත් කර ගත නොහැකි ය." මෙම ප්‍රශ්නයට කෙටි පිළිතුර නම් - එය ඔබට උවමනා එක නො වුනත් - ධනවාදයේ සමාජ-ආර්ථික අත්තිවාරම් පිළිබඳ විශ්ලේෂනයක් මත පදනම් වී ගන්නා බරපතල විප්ලවවාදී ක්‍රියා මාර්ගයක් තුල යුතෝපියාවට ලැබෙන්නේ එයට අයත් විය යුතු යයි තීන්දුව ඇති තැනම යඃ *එනම්, එය මාක්ස්වාදී ක්‍රියා මාර්ගයක කොටසක් නො වන බව ය.* අපි තව ටිකකින් මෙම කරුන විස්තාරනය කරමු; එහෙත් ප්‍රථමයෙන් අප ඔබගේ ලිපියට ආපසු එලඹිය යුතු ය. බීම්ස් උක්ත පාඨකයාට නිවැරදි ලෙස පිළිතුරු දීමට අසමත් වී යයි විරුද්ධත්වය පලකරමින්, ඔබ මෙසේ ප්‍රකාශ කලෙහි යඃ "ඔහුගේ (පාඨකයාගේ) ප්‍රශ්න සියල්ල සාර වසයෙන් ගත් කල්හි එක් ප්‍රශ්නයක් වෙයිඃ සමාජවාදීහු සමාජයක් දුවවන්නාහු නම් ඔවුන් කරනවා ඇත්තේ කුමක් ද? සත්තකින් ම විප්ලවයක් කැඳවා සිටින ව්‍යාපාරයක් එම ප්‍රශ්නයට ඒත්තු යන පිළිතුරක් දිය යුතුව ඇත, ඒ කියන්නේ පෘථුල සමාජ ප්‍රයුක්තීන් මාලාවක් සඳහා පිළිවෙත් ද මෙවන් විප්ලවවාදී ක්‍රියා මාර්ගයක් විසින් බිහි කෙරෙන සමාජය කුමන වර්ගයේ එකක් ද යන්න පිළිබඳ පැහැදිලි දෘෂ්ටියක් ද වේ. එසේ නැත හොත් විප්ලවය සඳහා කෙරෙන කැඳවුම තුල කිසියම් නො බැරෑරුම් බවක් පවතී."

හතර වන ජාත්‍යන්තරයට සහ එහි ශාඛාවන්ට ක්‍රියා මාර්ගයක් නැත; අපට "පුලුල් සමාජ ප්‍රශ්න මාලාවක් පිළිබඳව" පිළිවෙත් ඇත්තේ නැත; අපගේ ව්‍යාපාරය විප්ලවයක් ඉල්ලා සිටින්නේ ධනවාදයට විකල්ප ලෙස අප යෝජනා කර සිටින්නේ කුමන වර්ගයේ සමාජයක් ද යන්න පිළිබඳව කිසිදු පැහැදිලි වැටහීමකින් තොරව ය යන යෝජිතය මුලුමනින් ම පදනම් විරහිත ය. හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව තරම් පරිපූර්න වූ ක්‍රියා මාර්ගික ප්‍රකාශ මාලාවක් දරා සිටින අන් කිසිදු පක්ෂයක් ඇත්තේ නැත.[14] ක්‍රියා මාර්ගයකින් තොර යයි ඔබ ජාත්‍යන්තර කමිටුවට චෝදනා කර සිටුනා කල්හි, ඔබ සැබැවින් ම අදහස් කරන්නේ ක්‍රියාමාර්ගය හා කම්කරු පන්ති බලය සඳහා අරගලයට එහි පවත්නා සම්බන්ධය ද පිළිබඳ මාක්ස්වාදී සංකල්පය ඒ පිළිබඳ ඔබේ සංකල්පයට ප්‍රතිවිරුද්ධ බව ය. ඉදිරියේ දී අප විසින් පෙන්වා දෙන පරිදි විප්ලවවාදී ව්‍යාපාරය දේශපාලන ක්‍රියා මාර්ගයක සීමාවන්ට පිටස්තර වූ පශ්චාත්-විප්ලව පවුල අත් කර ගත යුත්තා වූ උචිත රූපාකාරය සහ කොමියුනිස්ට්වාදය යටතේ ලිංගිකත්වය අත්පත් කර ගනු ඇති ස්වභාවය වැනි විෂයයන් හා ප්‍රයුක්තයන් පිළිබඳව සමාජවාදී භක්ති ආඥාවන් නිකුත් කල යුතු යයි ඔබ විශ්වාස කරන්නෙහි ය. බ්‍රෙනර් සහෝදරය, ධනේශ්වර සමාජයෙහි වෛෂයික ප්‍රතිසතිතයන් තුල මුල් ඇදගත්තා වූ අන්තර්ගතයකින් යුක්ත වූ ද ධනේශ්වර පීඩනයට සූරාකෑමට හා අසමානතාවයට එරෙහිව තම අරගලය තුල දී කම්කරු පන්තියේ සමාජ-ආර්ථික අවශ්‍යතාවයන් ප්‍රකාශනයට පත් කරන්නා වූ ද ඉල්ලීම් සැකසීමට ඔබට එතරම් උනන්දුවක් ඇත්තේ නැත. ඒ වෙනුවට ඔබ ක්‍රියා මාර්ගය සංකල්පනය කර ගන්නේ, ඔබේ ලියුමේ පෙන්වා දෙන පරිදි "දසලක්ෂ සංඛ්‍යාත ජනකායගේ සිත්සතන් තුල සමාජවාදය ද යහපත් ජීවිතයක් ද එක්ව පවතින්නා වූ සමාජවාදී සිහිනයක්" ලෙස ය. යුතෝපියානුවාදය පුනර්ජීවනය කිරීමට ඔබ කරන කැඳවුමෙහි සාරභූත පදනම වන්නේ මෙය යි.

බීම්ස් බ්‍රෙනර්ගේ අගෝස්තු 29, 2002 පැමිනිල්ලට පිළිතුරු දුන් අවස්ථාවේ දී ඔහු එක් තීරනාත්මක ප්‍රයුක්තියක් කෙරේ අවධානය සංකේන්ද්‍රනය කලේ ය. "මා තහවුරු කරන්නා වූ ද ඔබ ඔය තරම් උග්‍රව විරුද්ධවන්නා වූ ද කාරනය නම් සමාජවාදී සමාජය වනාහි සමාජවාදීන් විසින් දුවවනු ලබන්නක් නො වන බව ය. ඒ වෙනුවට, එය වනාහි ජනගහනයේ අතිමහත් බහුතරය වන කම්කරු පන්තිය ඉතිහාසයේ ප්‍රථම වතාවට ආර්ථික සහ දේශපාලන බලය සියතට ගන්නා සමාජ රූපයක් වන බව ය. මෙහි ඉතා වැදගත් සංකල්පයක් පවතී! ශ්‍රමයේ විමුක්තිය සලසා ගත හැක්කේ කිසියම් අධිකාරයක් විසින් නිකුත් කෙරෙන වට්ටෝරු මාලාවක් තුලින් නො ව ජනතාව විසින් ම බව ය."

නික් බීම්ස්ගේ මෙම ලිපියට ප්‍රතිචාර වසයෙන් ඔබ යුතෝපියාව පිළිබඳ ඔබේ ප්‍රකාශනය නිෂ්පාදනය කලෙහි ය. මෙම ලිපියේ අධ්‍යාසය, ඔබ (බ්‍රෙනර් සහෝදරයා) අපට දැනුම් දුන් පරිදි දෙ-ආකාර වේ; පලමුව, මාක්ස්වාදය සහ යුතෝපියාව අතර සම්බන්ධතාවය පිළිබඳව පවත්නා "බරපතල ලෙස නොමග ගිය" සංකල්පයන් නිවැරදි කිරීම ය. දෙවනුව "යුතෝපියානුවාදය මාක්ස්වාදී ව්‍යාපාරය තුල තථ්‍යසම තහංචියක් බවට පත් කලා වූ විද්‍යාව සහ යුතෝපියානුවාදය අතර ආතතිය" පරීක්ෂා කිරීම ය.

"මෙම සියලු කරුනු පිළිබඳව නිර්නිත විග්‍රහයක් සඳහා පොතක් - දිග සාකච්ඡාවක් අවශ්‍ය වනු ඇත," යි අපට අනතුරු හඟවා ඔබ මෙම ප්‍රශ්නය පිළිබඳ ප්‍රතිපාදානය හුදු වචන 27,393කට සීමා කලෙහි ය. " කම්කරු පන්තිය තුල සමාජවාදී සංස්කෘතිය පුනරුත්පාදනය සඳහා යුතෝපියානුවාදය කෙරේ අලුත් කරන ලද අවධානයක් අවශ්‍ය බවට කරුනු තහවුරු කිරීමක් සඳහා මෙය සෑහේ ය"යි ඔබ අපට සහතික වූයෙහි ය.

## 12. මාක්ස් එංගල්ස් සහ යුතෝපියානුවාදය

අප කලින් ද පෙන්වා දුන් පරිදි බීම්ස්ට යුතෝපියනුවාදය පිලිබඳව පවත්නා "බරපතලව නොමග ගිය" අදහස් "මාක්ස්වාදී ව්‍යාපාරය තුල (දිගු කලක් තිස්සේ) පවත්නා අදහස අඟවන්නේ ය"යි ද, " යුතෝපියානුවාදය මාක්ස්වාදය තුල තථ්‍යසම තහංචියක් බවට පත් කල විද්‍යාව සහ යුතෝපියානුවාදය අතර ආතතිය" තුලින් බීම්ස්ගේ වැරදි පැන නගින්නේ යයි ද ඔබ කියා සිටින්නෙහි ය. තමන්ගේ ම ප්‍රති-විප්ලවවාදී හා ප්‍රතිසංස්කරනවාදී ඇජෙන්ඩාවන් තහවුරු කරලීම සඳහා සාවද්‍ය ලෙස මාක්ස් සහ එංගල්ස් යුතෝපියානුවාදයට සතුරු වූහ යි අභ්‍යර්ථනය කල 19 වන ශතවර්ෂයේ අවසාන භාගය දක්වා ඈත දින දරන දීර්ග සංශෝධනවාදී පරපුරක අලුත් ම පුරුක නික් බීම්ස් යයි ඔබ කියා සිටින්නෙහි ය. *The Civil War in France* (ප්‍රන්සයේ සිවිල් යුද්ධය, (මාක්ස් 1871 දී ලියූ) නමැති කෘතියෙන් උපුටා දක්වමින් ඔබ මෙසේ සත්ත කරයිඃ

> "මෙම ඡේදයේ දැක්වෙන යුතෝපියානුවාදය සහ මාක්ස්වාදය අතර සම්බන්ධතාවය මාක්ස්වාදීන් විසින් සාමාන්‍යයෙන් ඉදිරිපත් කැරෙන ආකාරයට වඩා කැපී පෙනෙන පරිදි වෙනස් ය. පසුව සඳහන් කල ආකාරය යන්නෙන් මා සාර වසයෙන් අදහස් කලේ මාක්ස්වාදය විසින් සමාජවාදය විද්‍යාවක් බවට පත් කල පසු යුතෝපියානුවාදය අනදාල බවට පත් වී ය යන මතය යි. මෙම මතය පදනම් වී ගත්තා වූ මූලික කෘතිය නම් එංගල්ස්ගේ *සමාජවාදයඃ යුතෝපියානු (මනෝරාජික) හා විද්‍යාත්මක* නමැති කෘතියයි. මෙම කෘතිය තුල දී සහ වෙනත් කෘතීන් තුල ඔහු (එංගල්ස්) ද මාක්ස් ද යන දෙදෙනා ම යුතෝපියානු සමාජවාදය ප්‍රගාඪ විවේචනයට ලක් කල බව ද එම විචාරය විද්‍යාත්මක සමාජවාදයේ සමස්ත ව්‍යාපෘතියට ම තීරනාත්මක වූ බවට ද කිසිදු සැකයක් ඇත්තේ නැත. එහෙත් මාක්ස්වාදයේ එලඹීම හෙගල්ගේ දර්ශනවාදය හෝ රිකාඩෝගේ දේශපාලන අර්ථ ශාස්ත්‍රය අනදාල බවට පත් නො කල පරිද්දෙන් ම, එම විචාරය යුතෝපියානුවාදය අනදාල බවට පත්කලේ ද නැත."

ඔබ විසින් මෙහි දී "අනදාල" යන වචනය වැද්ද ගැනීම වනාහි ශාබ්දික වසයෙන් රැවටිලිකාරී ක්‍රියාවකි. මෙහි දී ප්‍රයුක්තිය වනුයේ ශ්‍රේෂ්ඨ යුතෝපියානු සමාජවාදීන්ගේ අදහස් "අනදාල" ද යන්න නො වේ. නික් බීම්ස් එවන් ප්‍රකාශයක් කලේ නැත.

"අනදාල" යන පදය වනාහි බුද්ධිමය ඉතිහාසය හදාරන්නන් අතීතයේ මහා චින්තකයන්ගේ කෘතීන් පිලිබඳව යොදන්නක් නො වේ. චින්තකයින්ගේ සෑම නව පරම්පරාවක් ම ඔවුන්ට පෙර එලඹියන් විසින් පිහිටුවන ලද අත්තිවාරම් මත නැගී සිටී. මාක්ස්වාදය පිලිබඳ ගැඹුරු වැටහීමක් සඳහා ප්ලේටෝගේ පටන් 18 වන හා 19 වන ශත වර්ෂවල යුතෝපියානුවන් දක්වා සමාජවාදී චින්තනයේ සකල පූර්ව ගත ඉතිහාසයම *විචාරාත්මකව* උකහා ගැනීමත් අවශ්‍ය කරයි. කෙසේ වෙතත්, අතීත චින්තකයන්ගේ ප්‍රතිපදානයන් අගය කිරීම යන්නෙන් ඔවුන්ගේ න්‍යායයන්, ඒවායේ ඓතිහාසිකව දත්ත වූ ස්වරූපයෙන්, වත්මන් තත්වයන් තුල ද යොදාගත හැකි යයි අදහස් නො වේ.

මාක්ස් සහ එංගල්ස් විවිධ අවස්ථාවල දී නූතන *විද්‍යාත්මක* සමාජවාදය, සේන්ට්-සිමොං, ෆුරියර් සහ ඕවන් වැනි මහා යුතෝපියානුවාදීන්ට කොතරම් ඉමහත් බුද්ධිමය නයක් දරා සිටී දැයි අවස්ථා ගනනාවක දී පිලිගත්තාහු ය, එසේ ම ඔව්හු තමන්ගේ පූර්වප්‍රාප්තිකයන්ගේ ප්‍රතිපදානයන්හි ඓතිහාසිකව - සාධිත ස්වභාවය ද සීමාසහිත භාවය ද ඉතා සවිස්තරව පෙහෙලි කලහ. එංගල්ස් ලියා තැබූ පරිදි යුතෝපියානුවන්, "යුතෝපියානුවන් වූයේ ධනේශ්වර නිෂ්පාදනය ඒ වන විටත් එතරම්මැ සුලුවෙන් වර්ධනයව පැවැති තතු තුල ඔවුන්ට ඊට වෙනස් කිසිදු අයුරකින් නො පැවතිය හැකිව තිබුනු හෙයිනි. පැරනි සමාජය තුල නව සමාජයක මූලාංගයන් තව මත් පොදු වසයෙන් පෙනෙන්නට නො තිබුනු තතු තුල, ඒවා තමන්ගේ ම ඔලු තුලින් අවශ්‍යයෙන් ම නිර්මානය කිරීමට ඔවුන්ට සිදු වූයේ ය. මන්ද යත්, නව සාක්ෂ්‍යවල මූලික සැලැස්ම ඒ වන විටත් සමකාලීන සමාජ ඉතිහාසය තුලින් උකහා ගත නොහැකිව පැවැතියේ ය යන කරුන නිසා ඔවුන්ට ඉතුරුව පැවැතියේ තර්ක-බුද්ධියට ආයාචනය කිරීම පමනක් ම හෙයිනි". [*Marx Engels Collected Works*, volum 25 (මාක්ස් එංගල්ස් සංගෘහිත කෘති); 25 වන වෙලුම, නිව් යෝර්ක්, 1987; 253 පිටුව)].

යුතෝපියානුවාදය පිලිබඳ ප්‍රශ්නය ගැන මාක්ස් සහ එංගල්ස්ගේ මතයන් පසුව ආ පරම්පරාවන් විසින් වැරදිව ඉදිරිපත් කරන ලදැයි යන ඔබගේ කියාපෑම - එනම් පසුකලෙක ඔවුන් යුතෝපියානුවාදයට පමන ඉක්ම වූ විරෝධයක් දැක්වූයේ ය - යන්න පදනම් විරහිත ය. මාක්ස් හා එංගල්ස්ගේ *සංගෘහිත කෘතීන්ට* අත ගසා ගැනීමට හැකි උවමනා කෙනෙකුට ඔවුන් දෙදෙනා යුතෝපියානුවාදය කෙරේ දැක් වූ විචාරාත්මක ආකල්පය නිශ්චිතව සූත්‍රගත කල උද්ධෘතයන් නිමක් නැති සංඛ්‍යාවක් සොයා ගත හැකි වේ. සමාජවාදයේ වර්ධනයට එය ඉටු කලා වූ ප්‍රතිපදානයට අවශ්‍ය ගෞරවය පුද කරන අතර ම මාක්ස් සහ එංගල්ස් යුතෝපියානුවාදය අයත් වන්නේ විප්ලවවාදී සමාජවාදී ව්‍යාපාරයේ වර්තමානයට හා අනාගතයට නො ව අතීතයට බව අවධාරනය කලහ. ඔබ ම උපුටා දැක් වූ *ප්‍රන්සයේ සිවිල් යුද්ධය* නම් කෘතියේ ඡේදය තුල අවධාරනය කර ඇති කරුන ද මෙය මයි. බ්‍රෙනර් සහෝදරය, ඔබගේ මාක්ස්වාදය පිලිබඳ මෙට්ටැහි වූ අර්ථකථනයට එම ඡේදයෙන් රුකුලක් ලැබේ යයි කියා පෑමට ඔබ සමත් වූයේ කෙසේ ද යන්න සිතා ගැනීමට මට නම් නො හැකි ය. එයින් පෙහෙලි වන කරුන නම් ධනවාදයේ මුහුකුරා යාම විසින් කම්කරු පන්තිය විප්ලවවාදී පන්තිය හැටියට ප්‍රාදුර්භූත කලා වූ

මොහොතේ ම යුතෝපියානුවාදයේ යුගය අවසන් වූ බව ය. ඔබ උපුටා දක්වන කොටසට පෙර එන වාක්‍ය හතර ඇතුලත් කල කල්හි මෙම ආස්ථානය වඩාත් පැහැදිලි වෙයි:

"සමාජවාදී නිකායයන්හි සියලු සමාරම්භකයෝ, ධනේශ්වර සමාජයේ ගමන විසින් ම, කම්කරු පන්තිය ඓතිහාසික ක්‍රියාකාරකයන් ලෙස ලෝක කරලියට ඇතුලුවීමට තරම් පුහුනු හෝ සංවිධාන කරනු නො ලැබුවා වූ ද, පැරනි ලෝකය තුල ම ඔවුන්ගේ විමුක්තිය සඳහා ද්‍රව්‍යමය කොන්දේසි ඇති තරම් මෝරා ගොස් නො තිබුනා වූ ද සමයකට අයත් වෙති. ඔවුන්ගේ (කම්කරු පන්තියේ) දුක් විඳීම පැවැතුනි, එහෙත් ඔවුන්ගේ ම ව්‍යාපාරයක් උදෙසා සාධක තවමත් නො පැවැත්තේ ය. නිකායයන්හි යුතෝපියානු සමාරම්භකයෝ වර්තමාන සමාජය පිලිබඳ තමන්ගේ විචාරයේ දී පැහැදිලිව ම සමාජමය ව්‍යාපාරයේ අරමුන, එනම් පන්ති පාලනයේ සකල ආර්ථික කොන්දේසි ද සමග වැටුප් ක්‍රමය අහෝසි කර දැමීම විස්තර කල නමුත් සමාජය ප්‍රතිවර්තනය කිරීමේ භෞතික සාධකයන් ඔවුන්ට සමාජය තුලින් ම නො ලැබුනු අතර සංවිහිත බලය සහ ව්‍යාපාරය පිලිබඳ දැනුවත්භාවය සහිත කම්කරු පන්තියක් ද එහි නො වී ය. ව්‍යාපාරය එවකට මුහුන පා පැවැති ඓතිහාසික සාධකවල අඩුපාඩුව පිරිමසා ගැනීමට ඔවුන්ට කල හැකි වූයේ නව සමාජයක් පිලිබඳ විශ්මය ජනක පින්තූර හා සැලසුම් සැකසීමෙනි; ඒවා ප්‍රචාරය කිරීම ඔව්හු ගැලැවීමේ සැබෑ මාධ්‍යය ලෙස සැලකූහ." [*Marx Engels Collected Works*, volum 22 (මාක්ස් එංගල්ස් සංගෘහිත කෘති); 22 වන වෙලුම, නිව් යෝර්ක්, 1986; 499 පිටුව)].

ඔබ උද්ධෘතය අරඹන්නේ එතැන් පටන් ය:

"කම්කරු පන්ති ව්‍යාපාරය යථාර්තයක් වූ මොහොතේ පටන් විශ්මයාවහ යුතෝපියාවන් දිය වී ගියේ ය; ඒ මෙම යුතෝපියානුවන් විසින් ඉලක්ක කෙරුනු අරමුන කම්කරු පන්තිය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ නිසා නො වේ, ඔවුන් එය සාක්ෂාත් කිරීමට සැබෑ මාධ්‍යය සොයාගෙන තිබුනු හෙයිනි, එහෙත් ඒවා වෙනුවට ව්‍යාපාරයේ සැබෑ ඓතිහාසික කොන්දේසි තුලට අභිනිවේෂයක් ද කම්කරු පන්තියේ යුද්ධමය සංවිධානයේ ප්‍රගාමීව ඒකරාශී වන්නා වූ බලය ද සම්ප්‍රාප්ත විය. එහෙත් යුතෝපියානුවන් විසින් ප්‍රකාශිත කරන ලද අවසාන අරමුනු දෙක පැරිස් විප්ලවය විසින් ද ජාත්‍යන්තරය විසින් ද ප්‍රකාශිත කරන ලද අවසාන අරමුනු දෙකම විය. වෙනස් වන්නේ මාර්ගය පමනි; ව්‍යාපාරයේ සැබෑ තත්වයන් තවදුරටත් යුතෝපියානු උපමා කථාවලින් ව්‍යාකූල වී නැත." (එම පිටු 499-500).

තමන් කියවන දේ තේරුම් ගැනීමට සමත් ඕනෑ ම කෙනෙකුට ම සාකල්‍යයෙන් ම පැහැදිලි වන්නේ මාක්ස් යුතෝපියානුවාදය සමාජවාදයේ වර්ධනයේ පෙර අවධියකට, එනම් ධනවාදයේ වර්ධනය විසින් ද මහා කම්කරු පන්තියක ප්‍රාදුර්භූතවීමෙන් ද පරයා අතික්‍රමනය කරනු ලැබූ අවධියකට, අයත් යයි තර්ක කරමින් සිටින බව ය.

මාක්ස්ට, පැරිස් කොමියුනය නියෝජනය කලේ, ඔහු යුතෝපියානුවාදයේ අනන්ත රූපයන්ට එරෙහිව සමාජවාදී න්‍යාය විද්‍යාත්මක පදනමක තැබීම සඳහා අවුරුදු 30ක් සටන් කර, ගෙන ගොස් තිබුනු අරගලයේ උත්කෘෂ්ට ඓතිහාසික සාධනයයි. 1843-1847 අතර සමයේ මාක්ස් සහ එංගල්ස් විසින් කරන ලද න්‍යායික වැඩ කටයුතු - එහි ශ්‍රේෂ්ඨතම විජයග්‍රහනය වූයේ හෙගේලියානු විඥානවාදය විචාරනය කොට එම පදනමේ ඉතිහාසය පිලිබඳ භෞතිකවාදී සංකල්පය විස්තාරනය කිරීම යි - නූතන සමාජවාදී ව්‍යාපාරයේ දාර්ශනික හා දේශපාලන පදනම් තහවුරු කලේ ය. දෘඪ බුද්ධිමය ශ්‍රමයේ මෙම කාල පරිච්ඡේදය කොමියුනිස්ට් ප්‍රකාශනය ලිවීමෙන් කූටප්‍රාප්ත විය. මීලඟ 20 වසර තුල මාක්ස් සිය ශක්තීන් මුලුමනින් ම පාහේ කැප කලේ එම කෘතිය ඉදිරිපත් කලා වූ විප්ලවවාදී පර්යාලෝකය විද්‍යාත්මකව සාධනය කිරීමට ය. මෙම සාධනය ප්‍රධාන වසයෙන් ම සමන්විත වූයේ 1) දේශපාලන විශ්ලේෂනයේ උපකරනයක් ලෙස ඉතිහාසය පිලිබඳ භෞතිකවාදී සංකල්පය සාර්ථකව යොදාගැනීම ය. (මෙය, ලුවී බොනපාර්ට්ගේ ඒකාධිපතිත්වය පිහිටුවා ලූ කුප්‍රකට කුඩ්ටාව (රාජ්‍ය බල කොල්ලය) වැනි දේශපාලන වර්ධනයන් ගුඪ හරනයට ලක් කොට තර්ක-බුද්ධියානුකූලව වටහා ගැනීමට හැකි කලේ ය.) සහ 2) 1867 ප්‍රාග්ධනයේ ප්‍රථම වෙලුමෙන් කූටප්‍රාප්ත වූ, ධනේශ්වර සමාජයේ ගතිකය පාලනය කල ආර්ථික නියාමයන් සොයා ගැනීම ය.[15]

ජර්මානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ මුල් අවුරුදුවල දී, මාක්ස් සහ එංගල්ස් මෙම න්‍යායික විජයග්‍රහනයන්ගෙන් පසුබැසීමක් ප්‍රකාශයට පත් කලා වූ කුමන ප්‍රවනතාවයක් පිලිබඳව වුව දරුනු ලෙස විවේචනශීලී වූහ. කොමියුනය පාගා දැමීමෙන් සහ බිස්මාක්ගේ ජර්මානු අධිරාජ්‍යය තහවුරු කර ගැනීමෙන් ඉක්බිතිව ආ දේශපාලන ප්‍රතිගාමිත්වයේ වාතාවරනය තුල ඔවුන් දෙදෙනාට යලි යලිත් තමන් විසින් දශක ගනනාවකට පෙර ඛන්ඩනය කරන ලද, යල් පැනගිය දෘෂ්ටීන් පනගැන්වීමට උත්සාහ කල දේශපාලන-දෘෂ්ටිවාදී ප්‍රවනතාවයන්ට විරුද්ධව අලුතින් සටන් වැදීමට සිදු විය. 1877 ඔක්තෝබර් 19 දින මාක්ස් එවකට නිව් ජර්සි ප්‍රාන්තයේ හොබෝකන්හි වාසය කරමින් සිටි තම මිත්‍රයා වූ ෆ්‍රෙඩ්රික් ඇඩොල්ෆ් සෝර්ජ්ට කෝප සහගත පැමිනිල්ලක් ලියා යැවී ය.

"ජර්මනිය තුල අපගේ පක්ෂයේ, පලල් ජනයා අතර නො ව නායකයන් (ඉහල පන්ති හා "කම්කරු") අතර දූෂිත ගතිලක්ෂනයක් තහවුරු වී ගනිමින් පවතී. ලසාල්වාදීන් සමග සම්මුතිය දැන් වෙනත් වැනෙන්නන් සමග තව තවත් සම්මුතීන්ට මග පාදා ඇත: බර්ලිනයේ (මොස්ට් හරහා) ඩූරිං සහ ඔහුව "අගය කරන්නන්" සමග පමනක් නො ව යුක්තිය, නිදහස, සමානතාව හා සහෝදරත්වය පිලිබඳ සුරගනන් සහිත වත්මන් දේව පුරානයක්, යමෙකුට

ක්‍රියාත්මක වීම සඳහා බැඳීරුම්, වෛෂයික අධ්‍යයනයක් ඉල්ලා සිටින භෞතිකවාදී පදනම වෙනුවට, ආදේශ කිරීම මගින් සමාජවාදය සඳහා "වඩා උතුම් පරමාර්ථවාදී" දිශානතියක් සැපැයීමට උවමනාවෙන් පෙලෙන නො මේරූ උපාධි අපේක්ෂකයන් ද පමන ඉක්මවා ප්‍රඥාවන්ත වූ උපාධිධාරීන් ද ඇතුලු සම්පූර්න රොත්තක් සමග මෙම ප්‍රවනතාවේ නියෝජිතයෙක් වන සුකුන්ෆ්ට් (අනාගතය) සංස්කරනය කරන මහත්මයා හෙවත් ආචාර්ය හොක්බර්ග්[16] පක්ෂය තුලට "මුදල් මගින් ඇතුලුව" සිටී - සත්තකින් ම "උතුම් මැ" වූ චේතනාවන් සහිතව ය, එහෙත් මම 'චේතනාවන්' දොඹයක් තරම් වත් ගනන් නො ගනිමි.

"මොස්ට් මහතා සහ සමාගම මෙන්, තමන් ද වැඩ කිරීම අත හැර *වෘත්තියෙන් ආක්ෂරිකයන් බවට* පත් වූ කල්හි කම්කරුවෝ ද, අනිවාර්යයෙන් ම " න්‍යායික" විනාශයක් ඇති කරති; "උගත් ය" යි කියනු ලබන්නවුන් අතර ඔලුව අවුල් කරගත්තවුන් සමග සන්ථානයට සැම විට ම සූදානම්ව සිටිති. ප්‍රන්ස හා ඉංග්‍රිසි කම්කරුවන් ඉක්මවා යන 'න්‍යායික (හා එහෙයින් ම ප්‍රායෝගික) වර්ධනයක් ජර්මානු කම්කරුවන්ට අත් කර දෙනු ලැබුවේ, ඒ අනුගත ව්‍යුහය පිලිබඳ කල්පනයේ ක්‍රීඩාව - *යුතෝපියානු සමාජවාදය* - ඔවුන්ගේ හිස් තුලින් පලවා හැරීමට දශක ගනනාවකට පෙර අප ගත් ඉ මහත් වෙහෙස විසිනි. දැන් එය යලිත් වරක් වසංගතයක් සේ පැතිරයයි. මෙවර එය පැතිරෙන්නේ - මහා ප්‍රන්ස හා ඉංග්‍රිසි යුතෝපියානුවන් මතු නොව වයිට්ලිං සමග සංසන්දනය කල කල් හි පවා - වඩාත් නිෂ්පල වූ රූපයකිනි.[17] විචාරාත්මක සහ භෞතිකවාදී සමාජවාදයේ සම්ප්‍රාප්තියට පෙර ඒවායේ බීජ තමන් තුල දරා සිටි යුතෝපියානුවාදය, දැන් එම සම්ප්‍රාප්තියෙන් පසු, පෙනී යන්නේ තකතිරු පිලුනු වූ තරයේ ම ප්‍රතිගාමී ආකාරයකට ය." [*Marx Engels Collected Works*, volum 45 (මාක්ස් එංගල්ස් සංගෘහිත කෘති); 45 වන වෙලුම, මොස්කව්, 1991; 283-84 පිටු].

මෙම ඡේදය වනාහී සමාජවාදී ව්‍යාපාරය තුලට යුතෝපියානුවාදය යලිත් ආනයනය කිරීමට දැරෙන ප්‍රයත්නයන් පිලබඳ මාක්ස්ගේ ඇගැයීමේ සංක්ෂිප්ත සමාප්තියකි. ඔව්, බ්‍රෙනර් සහෝදරය නික් බීම්ස් විසින් යුතෝපියානුවාදය ප්‍රතික්ෂේප කිරීම ඔබ කියන පරිදි " මාක්ස්වාදී ව්‍යාපාරයේ පවත්නා වූ ද දිගු කලක් තිස්සේ පැවැත ආවා වූ ද මතය යි." එහෙත් මෙම "මතය" " නොමග ගිය" එකක් නම් ඔබේ භේදය පවතින්නේ නික් බීම්ස්ට වඩා ප්‍රථමයෙන් හා ප්‍රමුඛව මාක්ස් හා එංගල්ස් සමග ය.

## 13. යුතෝපියානුවාදයේ විඥානවාදී විධික්‍රමය

අදහස් වර්ධනය වන්නේ එක්තරා ඓතිහාසිකව නීර්නය වූ තර්කනයක් අනුව ය. ඔවුන්ගේ සමයේ නිෂ්පාදනයක් ලෙස, 18 වන ශතවර්ෂයේ අග ද 19 වන ශතවර්ෂයේ මුල ද මහා ප්‍රගතිශීලී යුතෝපියානුවන්ගේ සංකල්පනයන් එම යුගයේ භෞතිකවාදී දර්ශනවාදය මත පදනම්ව පැවතිනි. එහෙත් මූලික වසයෙන් ම යාන්ත්‍රික, ස්ථිතික සහ අනයිතිහාසික ස්වභාවයක් ඉසිලූ එම භෞතිකවාදය, ඒ නිසා සමාජ විඥානයේ වර්ධනයට හේතු දක්වීම සෑහෙන පමනට ඉටු කිරීමට අසමත් විය. මෙම වර්ගයේ භෞතිකවාදයේ සීමා සහිත බව එහි අතිශයින් ම අර්ථධාරී ප්‍රකාශනය අත්පත් කර ගත්තේ විඥානය ද ඔවුන් අධිභාෂනය කල සමාජ පරමාර්ථයන් සාක්ෂාත් කිරීම ද අතර සම්බන්ධතාවය පිලිබඳව යුතෝපියානුවන් දැරූ සංකල්පනය තුල ය. 18 වන ශතවර්ෂයේ ප්‍රන්ස භෞතිකවාදියෝ මිනිසා ඔහුගේ සමාජ පරිසරයේ නිර්මානයක් යයි කියා සිටියහ. ඔහුගේ ගුනවත්කම් හා දුෂ්ටකම් යන දෙකම මෙම වෛෂයික මූලාශ්‍රයෙන් පැන නැංගේ ය; එහෙයින් මිනිසාගේ ගුනවත්කම් වර්ධනය කොට දුෂ්ටකම් අහෝසි කිරීමට කල යුතු වූයේ මෙම සමාජ පරිසරයේ වෙනස්කම් ඇති කිරීම පමනි. මේ අනුව මිනිසාගේ විඥානය වෙනස් කිරීම සඳහා කල යුතු වූයේ එම විඥානය වර්ධනය වූ සමාජ පරිසරය වෙනස් කිරීම ය. එහෙත් මෙය තවත් ප්‍රශ්නයක් මතු කලේ ය. එය නම් මෙම පරිසරය වෙනස් කල හැක්කේ කෙසේ ද? යන්න යි. තමන්ගේ දර්ශනවාදය ගැලැවීමේ මාවතක් නො පෙන් වූ පරස්වාචකයක් තුල තමන් සිර වී සිටි බව ප්‍රන්ස භෞතිකවාදීන්ට දක්නට ලැබුනේ මෙතැනදී ය. මිනිසා වනාහි තම පරිසරයේ නිර්මානයකි. එහෙත් ඔවුන් තර්ක කලේ සමාජ පරිසරය වනාහි ... මහජන මතයේ නිර්මානයකි යනුවෙනි! මෙම නිගමනය 18 වන ශත වර්ෂයේ ප්‍රන්ස භෞතිකවාදීන්ව ගෙන'වුත් දැමුවේ කොතැනකට ද? මිනිසා ඔහුගේ සමාජ පරිසරයේ ඵලයක් වී නම් ඉන් එන නිගමනය ලෙස පෙනී යන්නේ එම මහජන මතය ම එම පරිසරයේ ප්‍රතිඵලයක් බව ය. එසේ වුව ද, තර්කය කනපිට පෙරලූ භෞතිකවාදියෝ දැන් සමාජ පරිසරය මහජන මතයේ නිර්මානයක් බවට පත් කලහ. ඉතින්, ඔවුන්ගේ ඥාන විභාගයේ සාරභූත වශයෙන් භෞතිකවාදී වූ පදනම් නො තකාම ප්‍රන්ස දාර්ශනිකයෝ සමාජ පරිසරයේ වෙනස්කම් ප්‍රධාන වශයෙන්ම රැඳී ගත්තේ චින්තනයේ වෙනස්කම් මත ය, එසේත් නැත හොත්, ප්‍රන්ස භෞතිකවාදීන් ම බොහෝ විට ප්‍රශ්නය මතු කල ආකාරයට "මානව ස්වභාවය" තුලය යන නිගමනයට එලඹුනාහ.

ප්‍රන්ස භෞතිකවාදයේ රාමුව තුල සමාජ පරිසර-මහජන මත පරස්වාචකයට විසඳුමක් සොයා ගත හැකි වූයේ නැත. ඒ වෙනුවට විසඳුමක් රැඳී පැවැත්තේ " මහජන මතය" මත ආයත්ත නො වූ, සමාජ පරිසරය ද සමාජ විඥානයේ රූපය හා දිශාව ද යන දෙක ම හැඩ ගැස්සූ වෛෂයික බලවේග සොයා ගැනීම තුල ය. මෙවන් වෛෂයික බලවේග සොයා ගැනීම වනාහි මාක්ස් සහ එංගල්ස් විසින් විස්තාරනය කරනු ලැබූ ඉතිහාසය පිලිබඳ භෞතිකවාදී සංකල්පයේ සුවිශේෂ විජයග්‍රහනය වූයේ ය.

බ්‍රෙනර් සහෝදරය, මේ සියල්ල හා ඔබගේ ලියවිල්ල අතර පවත්නා සම්බන්ධය කුමක් ද? යුතෝපියානුවාදය පුනර්ජීවනය කිරීම සඳහා තර්ක සෙවීමේ දී ඔබ 18 වන ශතවර්ෂයේ භෞතිකවාදීන් අමාරුවේ දැමූ එම න්‍යායික පරස්වාචකය ම අඩු හෝ වැඩි වශයෙන් යලි නිර්මානය කරන්නෙහි ය. එහෙත් ඔවුන්ගේ සාවද්‍යතා, සියත් බවේ ද සුධී භාවයේ ද චිත්තාකර්ෂනීය බවින් සමන්විත වූව ද, ඉන් අවුරුදු 250ට පසු ඔබගේ වැරැදි පෙනී යන්නේ නිකම්මැ තකතිරුකම් හැටියට ය. "මා ඉදිරිපත් කරන කේන්ද්‍රීය කාරනය නම්" යයි ඔබ ලියන්නෙහි ය. "යුතෝපියාව වැදගත් වන්නේ හරියට ම ඉතිහාසයේ එකම විප්ලවවාදී කර්තෘ වනාහි කම්කරු පන්තිය වන නිසා ය; *සමාජවාදය යලිත් වරක් මහා සමාජ පරමාදර්ශයක් වන තුරා, පලල් කම්කරුවන්, තරුන ජනයා, සහ බුද්ධිමතුන්ගේ අපේක්ෂාවන් සහ සිහිනවල කේන්ද්‍ර ලක්ෂය වන තුරා පන්ති විඥානය කවර කලෙක හෝ යලි පනගැන්වෙනු නැත.*'' (අවධාරනය එකතු කරන ලදී.)

අපි මෙම තර්කය එයට උචිත වූ අවධානයෙන් පරීක්ෂා කර බලමු:

"සමාජවාදය යලිත් වරක් මහා සමාජ පරමාදර්ශයක් වන තුරා, පන්ති විඥානය කවර කලෙක හෝ යලි පනගැන්වෙනු නැත." එහෙත් "පලල් කම්කරුවන්, තරුන ජනයා සහ බුද්ධිමතුන්ගේ අපේක්ෂාවන් සහ සිහිනවල කේන්ද්‍ර ලක්ෂය" ලෙස සමාජවාදය ඉස්මතු වීමේ එකම අර්ථය වනු ඇත්තේ පන්ති විඥානයේ යෝධ වර්ධනයක් සිදු වී ඇති බව යි. ඔබේ ප්‍රකාශයේ නග්න සාරයට ම උනා ලූ කල්හි ඔබේ සූත්‍රය පන්ති විඥානයේ පුනර්ජීවනය පරමාදර්ශයන්ගේ එනම් පන්ති විඥානයේ ම එක් අංශයක පුනර්ජීවනයක් මත ආයත්ත කරයි. ඔබට එය ම මෙසේ ද කිව හැකිව තිබුනි. "සමාජවාදය (පන්ති විඥානයේ විශේෂයෙන් ම දියුනු ප්‍රකාශනයක් වන) කවර කලෙක වත් සමාජවාදය මහා සමාජ පරමාදර්ශයක් බවට පත් වන තෙක් පුනර්ජීවනය වනු නැත." අපි පුනර්වාචක වටරවුමක හිරවී සිටිමු. සුපැහැදිලි ප්‍රශ්නයට පිලිතුරු දීමට ඔබ අසමර්ථ වන්නෙහි ය: සමාජවාදය "මහා සමාජ පරමාදර්ශයක්" බවට පත් වන්නේ කෙසේ ද? එම වර්ධනය සඳහා සැබෑ සමාජ-ආර්ථික ආවේගයක් සපයන්නා වූ වෛෂයික තතු පහලව ඇති ද? යාන්ත්‍රික භෞතිකවාදයට එරෙහි ඔබේ වාග් ප්‍රහාරය කොතරම් උග්‍ර වුව ද, ඔබ කරන්නේ එම චින්තන විධියේ ම අති මූලික අඩුපාඩු යලි නිපදවීම ම යි.

සමාජ විඥානයේ වර්ධනය පිලිබඳ විඥානවාදී සංකල්පයකට ආපසු ඇද වැටීම නො වැලැක්විය හැකි බවට පත් කල 18 වන ශතවර්ෂයේ භෞතිකවාදයේ යාන්ත්‍රික ස්වභාවය සමාජ-ආර්ථික සහ තාක්ෂනික වර්ධනයේ මට්ටම විසින් ඓතිහාසික වශයෙන් තීන්දු කරන ලද්දකි. නිෂ්පාදන බලවේගයන්ගේ සහ ඒවා විසින් පැන නැංවුනු සමාජ සම්බන්ධතාවන්ගේ වර්ධනය සමාජ විඥානයේ සැබෑ හා වෛෂයික අත්තිවාරම වන බව සොයා ගැනීම සඳහා අවශ්‍ය මට්ටමට කාර්මික ධනවාදය හෝ කම්කරු පන්තිය මුහුකුරා ගොස් තිබුනේ නැත. සමාජවාදී චින්තනය යුතෝපියානු ස්වභාවයක් අත් කර ගත්තේ ම සමාජ විඥානය ද සමාජ-ආර්ථික බලවේගයන්ගේ වෛෂයික වර්ධනය ද අතර සම්බන්ධතාවය සොයා ගැනීම සඳහා අවශ්‍ය ඓතිහාසික කොන්දේසි ඒ වන විටත් පැන නැගී නො තිබුනු නිසා ය. එතකුදු නො ව, විඥානයේ වෙනස්කම්වල වෛෂයික උල්පත අනන්‍ය කර ගැනීමට යුතෝපියානුවන් අසමත් වූ හෙයින් ම විඥානය වෙනස් කිරීමේ සන්තතිය සංකල්පනය කරනට හැකි වූයේ ප්‍රබුද්ධ පුද්ගලයන් විසින් ඉටු කරනු ලැබූ අධ්‍යාපනයේ අර්ථයෙනි.

1840 ගනන් වන විට බ්‍රිතාන්‍යයේ, ප්‍රන්සයේ සහ ජර්මනියේ ධනවාදයේ ද කම්කරු පන්තියේ ද සැලකිය යුතු වර්ධනයක් සිදු වී තිබුනි. සමාජ විඥානයේ රංගීය වෙනස්කම් ඇති කොට විවෘත පන්ති සට්ටනයේ ඉමහත් පුපුරා හැරීම් ජනනය කලා වූ වෛෂයික බලවේගයන් මහජනයාගේ සිතුම් පැතුම් කෙරෙන් සාපේක්ෂ ස්වාධීනත්වයකින් යුතුව ක්‍රියා කරන බැව් දුන් හඳුනාගත හැකි විය.

මෙම වර්ධනයන්ට මුහුන දුන් කල්හි, සමාජ විඥානයේ අති මූලික වෙනස්කම් දියුනු හා හුදෙකලා චින්තකයන්ගේ අධ්‍යාපන ප්‍රයත්නයන් මත ආයත්ත වන්නේ යයි සැලකූ සංකල්ප වඩ වඩාත් පැහැදිලි වන්නා වූ ප්‍රතිගාමී ස්වභාවයක් අත් කර ගත්තේ ය. ජර්මනියේ මෙවන් සංකල්ප ක්‍රිටිකල් ක්‍රිටික්ස් (විචාරත්මක විචාරකයන්) නමින් දන්නා ලද ප්‍රවනතාවයක් සමග සම්බන්ධව තිබුනි. එහි ප්‍රධාන නියෝජකයා වූයේ බෲනෝ බවර් ය. මෙම ප්‍රවනතාවය විශ්ලේෂනය කරමින් ඒංගල්ස් මෙසේ ලියා තැබී ය:

> "අදහස් ලෝකය පාලනය කරයි" - ප්‍රන්ස බුද්ධි ප්‍රබෝධනයේ ලේඛකයෝ එසේ ප්‍රකාශ කලහ. හෙගේලියානු විඥානවාදයට එරෙහිව කැරලි ගැසූ බවර් සහෝදරයෝ ද, අපට දැක ගන්නට හැකි වන පරිදි, එසේ ම කතා කලෝ ය. එහෙත් ලෝකය පාලනය වන්නේ අදහස්වලින් නම්, එපිට ඉතිහාසයේ ප්‍රධාන චාලකයන් වන්නේ පැරැන්න විවේචනය කොට නව මත නිර්මානය කරන මිනිසුන් ය. බවර් සහෝදරවරු සැබැවින් ම එසේ සංකල්පනය කලහ. ඔවුන්ගේ මතයට අනුව ඓතිහාසික සන්තතියේ සාරය වනාහී පවත්නා මත ගබඩාව සහ එම මත විසින් හැඩ ගස්සනු ලැබූ සමාජ ජීවිතයේ රූපයන්
>
> "විචාරාත්මක අධ්‍යාසය" විසින් යලි හැඩ ගස්වාලීම ය...
>
> තමා ඉතිහාසයේ ප්‍රධාන ගෘහකාරකයා, නිර්මාපකයා යයි සිතා ගත් පසු "විචාරාත්මකව සිතන මිනිසා" එමගින් තමා ද තමා වැනියවුන් ද මානව

වර්ගයේ විශේෂ, ඉහල ප්‍රභේදයක් ලෙස වෙන් කර ගනී. මේ ඉහල ප්‍රභේදය ජනකායට ප්‍රති සන්දනය කරනු ලැබේ.

"විචාරාත්මකව සිතන්නා" ගේ පෞරුෂයන්ගේ නිර්මානාත්මක හස්තවල මැටි පිඩු ලෙස හැසිරීම පමනකි ජනතාවට කල හැක්කේ." [ *The Development of The Moniest View of Histtory* (ඉතිහාසය පිලිබඳ අද්වෛතවාදී දෘෂ්ටියේ වර්ධනය) මොස්කව්, 1974; 118-19 පිටු.]

# මතු සම්බන්ධයි

# සටහන්

13. එහි ගතිය දක්වන ඡේද කීපයක්: "ජීව ස්වභාවය ලිංගේන්ද්‍රිය ආශ්‍රිත ලිංගික ක්‍රියාවන්ට ප්‍රේරනයක් සපයයි නම්, ජීවන ස්වභාවය මුඛ ආශ්‍රිත ලිංගික ක්‍රියාවන්ට ද ප්‍රේරනයක් සපයතැයි පිලිගැනීමට ද අප එකඟ විය යුතු ය. දෙවැන්න, ස්ත්‍රී පුරුෂ ලිංග දෙකට ම තෘප්තියක් ලබා ගත හැකි ක්‍රමයකි. කාම රාගය පුරුෂ ලිංගයට බාර කිරීම මගින් ජීව ස්වභාවය, පුරුෂ ලිංගය ස්ත්‍රී යෝනිය තුලින් ම තෘප්තියක් ලබතැයි තීන්දු කරන්නේ නැත. එයට වෙනස්ව එම කටයුත්ත සඳහා ලිංග දෙකටම අයත් මුඛය, ගුද මාර්ගය, යන දෙකම යොදාගත හැකිය. ස්වයං තෘප්තික ක්‍රියාව ද මීට ඇතුලත් කල යුතු ය." සහ "සත්තකින්ම මිනිසෙකු ගැහැනියක් මත්තේ නැගගෙන තම පුරුෂ ලිංගය ඇයගේ යෝනිය තුලට, තම ශුක්‍ර මෝචනය වන තෙක් යලියලිත් තල්ලු කිරීමෙන් කිසිදු ලිංගික මුහුකුරා ගිය බවක් හෝ පූර්න වර්ධනයක් හෝ පෙන්නුම් කරන්නේ නැත; ඒ වෙනුවට ඒ ක්‍රියාව පෙන්නුම් කරන්නේ දැඩි ලිංගික අවරෝධනයකි; ලිංගික ක්‍රියාකාරිත්වය යාන්ත්‍රික, අමානුෂික හිරිකිතයකට ඇද දැමීමකි."

14. (1938 දක්වා දිවෙන) හතර වන ජාත්‍යන්තරයේ ද එහි ශාඛාවන්හි ද ක්‍රියාමාර්ගික වාර්තාව සටහන් කෙරෙන ලියවිලිවල සම්පූර්න එකතුවක් වෙලුම් දුසිම් ගනනක් කරා දිවෙනු ඇත. සංක්ෂිප්ත භාවය තකා 1995 ජූනියේ වර්කර්ස් ලීගය සමාජවාදී සමානතා පක්ෂය බවට ප්‍රතිවර්තනය කිරීම යෝජනා කරමින් මා ඉදිරිපත් කල ලියවිල්ලෙන් අපගේ ක්‍රියාමාර්ගික ආස්ථානය දක්වෙන කොටසක් ගෙන හැර දක්වන්නෙමි:

"පක්ෂයේ අරමුන, කම්කරුවන්ට වටහා ගැනීමට ද අනන්‍ය වීමට ද හැකි වන ආකාරයකට නමෙහි කෙලින් ම කියවිය යුතු ය. ඇත්ත වසයෙන් ම සාකච්ඡාවක් අවශ්‍ය ය. විකල්පයන් යෝජනා කල යුතු ය. එහෙත් මම මේ අවස්ථාවේ දී යෝජනා කරන්නේ වර්කර්ස් ලීගය සෝෂලිස්ට් ඊක්වලිටි පාටි - සමාජවාදී සමානතා පක්ෂය - ලෙසට පරිවර්තනය කිරීම ආරම්භ  කල යුතු ය යන්න යි.

"කොටින් කිව හොත්, පක්ෂය කම්කරු පන්තියට ඉදිරිපත් කිරීමේ දී, එහි අරමුන වනාහි කම්කරුවන්ගේ ආන්ඩුවක් පිහිටු වීම යයි අප විසින් පැහැදිලි කල යුතුව ඇත. ඉන් අප අදහස් කරන්නේ කම්කරුවන් සඳහා, කම්කරුවන් විසින් කෙරෙන කම්කරුවන්ගේ ආන්ඩුවකි. එවන් ආන්ඩුවක්, කම්කරු පන්තියේ අවශ්‍යතාවන්ට අනුව ආර්ථික ජීවිතය ප්‍රතිසංවිධානය කිරීමට, ධනවාදයේ සමාජීයව-විනාශකාරී වෙලඳ පොල බලවේග ජයගෙන ඒවා ප්‍රජාතන්ත්‍රීය සමාජ සැලසුම්කරනය මගින් විස්ථාපනය කිරීමට, වැඩ කරන ජනතාවගේ හදිසි සමාජ අවශ්‍යතා ඉටුවන පරිදි නිෂ්පාදනයේ රැඩිකල් ප්‍රතිසංවිධානයක් සිදු කිරීමට, වැඩ කරන ජනගහනයට වාසි සහගත වන පරිදි ධනය රැඩිකල් හා සමාජීයව-යුක්තියුක්ත ලෙස යලි බෙදා හැරීමට, එමගින් සමාජවාදය සඳහා පදනම දැමීමට, දේශපාලන බලය - හැකි නම්, ප්‍රජාතන්ත්‍රීය විධි ක්‍රමයන් මගින් සාක්ෂාත් කර ගැනීමට බලාපොරොත්තු වන - භාවිත කරනු ඇත.

"සමාජවාදී සමානතා පක්ෂයේ මෙම අරමුනු සාක්ෂාත් කර ගත හැකි වන්නේ කම්කරු පන්තියේ දැනුවත්ව ජාත්‍යන්තරවාදී වූ ව්‍යාපාරයක් හා සහයෝගීව එහි අවියෝජනීය කොටසක් ලෙස ම පමනක් ය යන්න අපි අවධාරනය කරමු. අන්තර්-ජාතික සංගත සහ බහු ජාතික සමාගම් අනෙකුත් රටවල සිටින ඇමරිකානු කම්කරුවාගේ පන්ති සහෝදරයන් සහ සහෝදරියන් පීඩාවට පත් කිරීම ද සූරා කෑම ද කරන තාක් ඇමරිකානු කම්කරුවාට සමාජ සමානතාවක් හෝ සමාජ යුක්තියක් තිබිය නොහැකි ය. එපමනක් නොව පන්ති අරගලය පදනම් කල හැකි ජීව-ශක්‍ය ජාතික මූලෝපායක් ද නැත. කම්කරු පන්තිය ස්ථිරසාරව ද ක්‍රමානුකූලව ද තම ජාත්‍යන්තර මූලෝපාය අන්තර්ජාතික සංගතවල ජාත්‍යන්තර මූලෝපායට එරෙහිව පිහිටුවිය යුතු ය. මෙම සාරභූත ප්‍රශ්නය පිලිබඳව සම්මුතියක් තිබිය නොහැකි ය. සමාජවාදී ක්‍රියා මාර්ගයේ කැපෙන මුවාත එය යි.

"කම්කරු පන්තිය දේශපාලනිකව සංවිධානය කිරීමට යත්න දැරීමේ දී සමාජවාදී සමානතා පක්ෂය පවත්නා සමාජ තත්‍ව තුලින් පැන නගින්නා වූ ජනතාවගේ දැවෙන අවශ්‍යතාවන්ට ප්‍රතිචාර දක්විය යුතු ය. ජාත්‍යන්තර ප්‍රාග්ධනය කම්කරු පන්තියට එරෙහිව නිර්දය ප්‍රහාරයකට එලඹ සිටින කලෙක කම්කරු පන්තියේ මූලික අවශ්‍යතා ප්‍රකාශ කෙරෙන සමාජමය ඉල්ලීම් ගම්‍යව මෙන් ම විෂදව ද විප්ලවවාදී ස්වභාවයක් උසුලයි. ඇත්තට ම, ප්‍රතිසංස්කරනවාදී පියවරයන් මගින් ප්‍රතිසංස්කරනවාදී ඉල්ලීම් දිනා ගැනීමේ ඉඩක් තිබුනි නම්, එම සංවිධාන විසින් එම ඉල්ලීම් අතහැර නොදමනු ඇත. සත්තකින් ම ඉතා ම මූලික කොන්දේසි සඳහා වුව කම්කරු පන්තියේ සෑම ඉල්ලීමක් ම ක්ෂනිකව ඉස්මතු කරන්නේ කම්කරු පන්තිය හා ධනේශ්වර රාජ්‍යය අතර සෘජු මුහුනට මුහුනලා කෙරෙන ගැටුමකි.

"අපි අපේ ක්‍රියාමාර්ගයට ඇතුලත් කෙරෙන ඉල්ලීම් සවිස්තරව සටහන් කල යුතු ය. එහෙත් අනාගත සමාජවාදී මනෝරාජ්‍යයක පූර්න පිටපතක් බඳු ක්‍රියාමාර්ගයක් ලිවීම අවශ්‍ය නැත. ඒ වෙනුවට එය කම්කරු පන්තියේ වෛෂයික අවශ්‍යතාවන්ට සම්පාත වන්නා වූ ඒකකාරක අරමුනක් සම්පාදනය කල යුතු ය. එමතු නොව මහජනතාවගේ විඥානයේ තතක් හැඩවිය යුතු ද වේ. සමාජවාදී සමානතාව සඳහා ඉල්ලීම සමාජවාදී ව්‍යාපාරයේ මූලික ඉල්ලීම සාරාංශ කරනවා පමනක් නොවේ. එය ඇමරිකානු කම්කරුවන්ගේ ප්‍රජාතන්ත්‍ර හා විප්ලවවාදී සම්ප්‍රදායයන් තුල එතරම් ම ගැඹුරට කා වැදී ඇති සමානතාවාදී සම්ප්‍රදායයන් ඉස්මතු කරයි. ඇමරිකානු ඉතිහාසයේ සියලු ම සමාජ අරගල තමන්ගේ ධජයේ සමාජ සමානතාව සඳහා වූ ඉල්ලීම සටහන් කර ගත්තේ ය. දේශපාලන ප්‍රතිගාමිත්වයේ වාතාවරනය තුල මෙම පරමාර්ථය රුදුරු ලෙස ප්‍රහාරයට ලක් වී තිබීම අහම්භයක් නොවේ." සම්පූර්න වාර්තාව බලන්න: [http://www.wsws.org/sections/category/icfi/wlsep.shtml]

15. මාක්ස්ගේ උල්පත් පිලිබඳ මහාර්ඝම විස්තර කථනය දක්වෙන්නේ එංගල්ස්ගේ *සමාජවාදය: මනෝරාජ්‍යයෙන් (යුතෝපියාවෙන්) විද්‍යාවට* නමැති කෘතියේ ය. මුලු පාඨයම උපුටා දක්වීමට පවත්නා පෙලඹීම මැඩ ගෙන මම ඉතාම අදාල ඡේදය පමනක් ඉදිරිපත් කරමි:

"හේගල් ඉතිහාසය අධ්‍යාත්මවාදයෙන් මුදා ගත්තේ ය. ඔහු එයට දයලෙක්තික පදනමක් සැපයීය. එහෙත් ඉතිහාසය අරභයා ඔහුගේ සංකල්පනය හරය අනුව විඥානවාදී විය. දූන් විඥානවාදය සිය අවසාන ආරක්ෂක ස්ථානය වන ඉතිහාසය පිලිබඳ දර්ශනවාදයෙන් පන්නා දමා තිබිනි. ඉතිහාසය පිලිබඳ භෞතිකවාදී සංකල්පනය ඉදිරිපත් කැරිනි. පෙර කල පරිදි මිනිසාගේ විඥානය පදනම් කැරැ ගෙන ඔහුගේ පැවැත්ම විස්තර කරනවා වෙනුවට ඔහුගේ පැවැත්ම පදනම් කොටැ ගෙන ඔහුගේ විඥානය විස්තර කිරීමේ ක්‍රමය සොයා ගන්නා ලදි.

"එතුවක් පටන් සමාජවාදය, එක් හෝ තවත් මහා ප්‍රාඥයෙකුගේ බුද්ධි නිර්මානයෙහි අහම්බෙන් හටගත් ඵලයක් සේ නොව, ඓතිහාසික ලෙස පැන නැගුනු පන්ති දෙකක් අතර — නිර්ධන පන්තිය සහ ධනපති පන්තිය අතර අරගලයෙහි අත්‍යාවශ්‍ය ප්‍රතිඵලයක් ලෙස සලකන ලදි. එහි කාර්ය භාරය හැකි තරම් දූරට සර්ව සම්පූර්න සමාජයක් නිර්මානය කිරීම නොව, මෙම පන්ති සහ ඒවායේ ප්‍රතිඝතිතාවයන් පැන නැගීමට හේතු වූ ඓතිහාසික ආර්ථික ක්‍රියා සන්තතිය පිරික්සා බැලීම හා එලෙස හටගත් ආර්ථික තත්වයන් තුලින් ගැටුම නිරාකරනය කිරීමේ මාධ්‍යයන් සොයා ගැනීම ය. එහෙත් පෙර පැවති සමාජවාදය මෙම භෞතිකවාදී සංකල්පනය සමග කෙහෙත් ම නොගැලපුනේ, ප්‍රන්ස භෞතිකවාදීන්ගේ ස්වභාව ධර්මය පිලිබඳ සංකල්පනය සමග දයලෙක්තිකය සහ ප්‍රකෘති විද්‍යාව නොගැලපුනු ආකාරයටමය. පෙර පැවැති සමාජවාදය එවකට තිබුනු ධනවාදී නිෂ්පාදන ක්‍රමය සහ එහි විපාක ඵලයන් විවේචනය කලද, එයට අර්ථකථනයක් දීමට සමත් නොවූ හෙයින්, එය මැඩ නැගී සිටීමෙහි ලා අපොහොසත් විය. එම සමාජවාදයට කල හැකි එකම දේ වූයේ ධනවාදී සමාජය අයහපත් දෙයක් බව ප්‍රකාශ කිරීම පමනකි. ධනපති ක්‍රමය යටතේ වලක්වා ලිය නොහැකි දෙයක් වූ කම්කරු පන්තිය සූරාකෑමට හසු කිරීම පෙර පැවති සමාජවාදය විසින් හෙලා දැකීම ප්‍රබල වූ තරමට, එම සූරාකෑම කුමකින් සමන්විත වී තිබේද, එය කෙලෙස පැන නැගේද යන්න පැහැදිලි කිරීමට තරම් තත්වයක එය නොපැවතියේ ය. එහෙත් මෙය සපුරාලනු වස් එක් පසෙකින් ධනවාදී ක්‍රමය ඓතිහාසීය සබඳතාවය සමග හා විශේෂ ඓතිහාසික කාල සීමාවක් තුල දී එහි නොවැලැක්විය හැකි තාවය දක්වමින් එය ගොඩනගා ලීමද එනයින් එහි විනාශයේ නොවැලැක්විය හැකි තාවය ඉදිරිපත් කිරීම ද, අනික් පසින් ඒ වන තුරු රහසක්ව පැවති ධනවාදී නිෂ්පාදන ක්‍රමයේ අභ්‍යන්තරික ස්වරූපය හෙලිදරවු කිරීම ද අවශ්‍ය විය. *අතිරික්ත වටිනාකම* සොයා ගැනීමට කෘතඥ වන්නට එය සපුරාලන ලදි. ධනවාදී නිෂ්පාදන ක්‍රමයේත්, එය තුල කම්කරුවා සූරාකෑමට හසු වීමේත් පදනම වන්නේ ගෙවීමකින් තොරව, ශ්‍රමය අයත් කැරැ ගැනීම වන බව ද, ධනපතියා වෙලඳ පොලේදී කම්කරුවාගේ ශ්‍රම ශක්තිය සඳහා එහි පූර්න වටිනාකම ගෙවා එය වෙලඳ භාන්ඩයක් ලෙස මිල දී ගත්ත ද, ඔහු ඒ සඳහා ගෙවූ වටිනාකමට වඩා වැඩි වටිනාකමක් ඉන් ලබා ගන්නා බවද, එමෙන්ම අවසානයේ දී ධනය සතු පන්ති අසමුච්ච ගත වන, නිරතුරු වැඩි වන, ප්‍රාග්ධන ස්කන්ධයක් බවට පත් වන වටිනාකම්වල සමස්තය සෑදෙන්නේ මෙම අතිරික්ත වටිනාකමෙන් බවද ඔප්පු කොටැ පෙන්වන් ලදී. ධනේශ්වර නිෂ්පාදනයේ උත්පත්ති කතාව ද, ප්‍රාග්ධන නිෂ්පාදනය ද යන දෙක ම මෙසේ පැහැදිලි කෙරින.

"ඉතිහාසය පිලිබඳ භෞතිකවාදී සංකල්පනය සහ ධනවාදී ක්‍රමයේ රහස හෙලිදරවු කරන අතිරික්ත වටිනාකම නමැති මෙම ශ්‍රේෂ්ඨ සොයාගැනීම් දෙක නිසා අපි මාක්ස්ට නය ගැති වමු. මෙම සොයා ගැනීම් දෙකට කෘතඥ වන්නට සමාජවාදය විද්‍යාවක් බවට පත් විය. එහි විස්තර සහ අන්‍යොන්‍ය සම්බන්ධකම් සියල්ල තවදුරටත් නිසි ලෙස සකස් කිරීම ඊලඟට කල යුතු ප්‍රධාන දෙය විය." (*මාක්ස් සහ එංගල්ස් තෝරා ගත් කෘති වෙලුම් හතර*, වෙලුම 3, මොස්කව් 1982, පිටු 87-89)

16. කාර්ල් හොච්බර්ග් (1853-1885) සමාජවාදී ව්‍යාපාරයේ ධනවත් ආධාරකරුවෙක් විය.

17. විල්හෙල්ම් වයිට්ලිං (1808-1871) 1830 ගනන්වල අග හා 1840 ගනන්වල දී තරුන ජර්මානු කම්කරු ව්‍යාපාරයේ මුල්ම නායකයන්ගෙන් එකෙකු විය. "ආවේගභරිත ආදර-තොරොම්බලයක්" යයි එංගල්ස් විසින් විස්තර කරනු ලැබූ යුතෝපියානු කොමියුනිස්ට්වාද විශේෂයක් ඔහු වගා කලේ ය.

© www.wsws.org